බේරුවල නගර සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බේරුවල නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.36 (අ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ මැනීමේ පදනම හෙළිදරව් කිරීමේදී සවි කිරීම් උපකරණවල වාර්ෂික ක්ෂය අනුපාතය සියයට 10 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල එම වත්කම් සියයට 20 බැගින් ක්ෂය කර තිබීමෙන් සවිකිරීම් ක්ෂය රු.237,365 කින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ) ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.28 සිට 3.32 ඡේදයන්ට අනුකූලව වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.	-එම-	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඇ) ප්‍රමිතියේ 5 වන පරිච්ඡේදයේ 5.14 (ආ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයට උචිත වර්ගීකරණයන් හී ධාරණ වටිනාකම හෙළිදරව් කළ යුතු වුවද මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 15 යටතේ කාණ්ඩ අනුව අවසන් තොගය වර්ග කර තිබුණද එහි වටිනාකම් වෙන් වෙන්ව නොදක්වා මුළු වටිනාකම පමණක් දක්වා තිබුණි.	-එම-	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඈ) ප්‍රමිතියේ 9 වන පරිච්ඡේදයේ 9.9 හා 9.14 ඡේද ප්‍රකාරව ප්‍රාග්ධන ප්‍රදාන වියදම් සඳහා රජයෙන් කරන පැවරුම් හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් හැර වෙනත් පාර්ශවයන්ගෙන් කරන පැවරුම් මූලිකව වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත යුතු අතර වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් පැවරුම්වලින් අයභාරය ලෙස හඳුනාගත් වටිනාකම් වෙනත් විස්තීර්ණ	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

ආදායමෙන් අඩු කළ යුතු වුවත්, එපරිදි හඳුනාගත් බවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන් හෝ ඊට අදාල සටහන් 05 හා 10 මගින් අනාවරණය නොවුණි.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා බෝක්කු,මාර්ග හා ගොඩනැගිලි වෙනුවෙන් ලැබී තිබුණු එකතුව රු.5,883,532 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත නොකිරීම නිසා ප්‍රාග්ධන ප්‍රදාන සහ දේපළ , පිරියත හා උපකරණ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති බව.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසානයේ ණයහිමි ලෙස රු.25,997,887ක් බැර කර තිබුණද ලෙජර් ගිණුමට එය රු.23,940,802 ක් ලෙස ගැලපුම් කර තිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව .	ජර්නල් සටහන් ලෙජර් ගිණුම්වලට නිවැරදිව ගැලපිය යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය සඳහා රු.3,836,471 ක් වූ ස්ථාවර තැන්පතු පොලිය ආදායමක් ලෙස දක්වා නොතිබුණු හෙයින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.3,836,471 ක් අඩුවෙන් දැක්වේ.	-එම-	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.890,377 ක් වූ ආයුර්වේද භාණ්ඩ තොගය ගිණුම්ගත නොකිරීමෙන් වර්ෂයේ ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	-එම-	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඉ)	ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල ලද වැටුප් රු.6,922,374ක්, ලැබිය යුතු වැටුප් රු.7,633,433 ක් ලෙස ගිණුම්ගතවීමේ වරද නිවැරදි කිරීමේදී රු.6,922,374 ක් පමණක් ගැලපුම් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් ශේෂය හා ජංගම වත්කම් රු.711,059 ක් වැඩියෙන් දක්වා තිබුණි.	-එම-	ජර්නල් සටහන් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයට අදාලව ආදායමට හඳුනාගත යුතු ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම ගිණුම්ගත කිරීමේදී ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම හර කර පුනරාවර්තන නොවන වියදම් සඳහා වන රජයේ පැවරුම් ගිණුම බැර කිරීම වෙනුවට එකතුව රු.743,111 ක් කෙරීගෙන යන වැඩ ගිණුම හර කර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව .	ජර්නල් සටහන් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(උ)	සභාව සතු පොත්පත් හා ලේඛන අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.933,996 ක ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමක් ආදායමට හඳුනාගත යුතු වුවත්,	පිළිතුරු ලබාදී නොමැත.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එය රු.1,000,000 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.66,004 ක් වැඩියෙන් දැක්වේ.		
(ඍ) පෙර වර්ෂයේ ණයහිමියන්ට රු.130,322 ක් වැඩියෙන් වෙන් කර තිබීම නිවැරදි කිරීමේදී ණයහිමි ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කළ යුතු වුවත්, සමුච්චිත අරමුදල් ගිණුම හර කර ණයහිමි ගිණුම බැර කර තිබීම නිසා ණයහිමි ශේෂය සහ සමුච්චිත අරමුදල් ශේෂය පිළිවෙලින් රු.260,644 ක් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ සිට නිවැරදිව ගැලපුම් කරන බව .	ජර්නල් සටහන් මගින් ලෙජර් ගිණුම් නිවැරදිව ගැලපිය යුතුය.
(එ) සටහන් අංක 16 සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.5 අනුව සමාලෝචිත වර්ෂයට අදාල පුස්තකාල පොත් ක්ෂය රු.434,482 ක් විය යුතු වුවත් එය රු.197,176 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය රු.237,306 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව .	ජර්නල් සටහන් මගින් ලෙජර් ගිණුම් නිවැරදිව ගැලපිය යුතුය.
(ඒ) 2022 වර්ෂයේ අපහරණය කළ ට්‍රේලර් 08 කට අදාල රු.143,002 ක් වූ සමුච්චිත ක්ෂය , ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙන් ඉවත් නොකිරීමේ වරද නිවැරදි කිරීමේදී ක්ෂය වෙන් කිරීමේ ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුම හර කර සංචිත හා වෙන් කිරීම් ගිණුම බැර කර තිබුණි.	පිළිතුරු ලබාදී නැති බව.	ජර්නල් සටහන් මගින් ලෙජර් ගිණුම් නිවැරදිව ගැලපිය යුතුය.
(ඔ) සූර්ය පැනලයෙන් ජනනය වන අතිරික්ත විදුලි ඒකක වෙනුවෙන් ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවල ලැබිය යුතු ආදායම පිළිවෙලින් රු.27,170 ක් සහ රු.29,656 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත නොකිරීම නිසා අතිරික්තය රු.56,826 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව .	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඕ) ප්‍රාග්ධන ප්‍රදාන හා සභා අරමුදල් පිළිවෙලින් රු.1,000,000 ක් හා රු.7,821 ක් වැය කර 2023 වසරේ නිම කරන ලද එකතුව රු.1,007,821 ක් වූ ජොසප් කුරේ මාවත ප්‍රාග්ධනිත නොකිරීමේ වරද නිවැරදි කිරීමේදී ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම හා සමුච්චිත අරමුදල් ගිණුම පිළිවෙලින් රු.1,000,000 ක් හා රු.7,821 ක් බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට රු.1,007,821 ක් බැර කර තිබුණි.	-එම-	ජර්නල් සටහන් මගින් ලෙජර් ගිණුම් නිවැරදිව ගැලපිය යුතුය.
(ක) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ සමුච්චිත අතිරික්තය යටතේ සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂයට ගලපන ලද පූර්ව කාල පරිච්ඡේදයේ වැරදිවල වටිනාකම ලෙස සමුච්චිත අරමුදලේ ආරම්භක ශේෂය වූ රු.601,852,761 ක් දක්වා තිබූ අතර වර්ෂයේ අතිරික්තය වූ රු.7,694,809 වෙනුවට	-එම-	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.

විස්තීර්ණ ආදායම රු.6,970,556 ක් ලෙස ගැලපුම් කර තිබුණි.		
(ග) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව ශුද්ධ වත්කම් වටිනාකම රු.670,709,699 විය යුතු වුවත්, එය රු.663,739,149 ලෙසත් , ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය අනුව එදිනට ශුද්ධ වත්කම් ශේෂය රු.608,823,318 ක් ලෙසත් දක්වා තිබුණි.	-එම-	-එම-
(ජ) සමාලෝචිත වර්ෂය සඳහා ලද රජයේ හා පෞද්ගලික ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු.5,883,532 ක් හා රු.5,823,500 ක් වශයෙන් එකතුව රු.11,707,032 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම් නිවැරදිව ගිණුමෙන් නිවැරදි කරන පිළියෙල කළ යුතුය. බව .	

1.6.3 නොසැසඳූ පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 ක ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල/ ලෙජර්වල දැක්වෙන ශේෂයන් අතර නොසැසඳූ රු.31,563,396 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කරන බව.	වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් විෂයයන් 03ක එකතුව රු.8,983,161ක් සඳහා උපලේඛන හා කාල විශ්ලේෂණ පිළියෙළ කර විගණනයට ඉදිරිපත් කිරීමට කළමණාකරණය අපොහොසත් විය.	ඉදිරියේදී උපලේඛන සකස් කරන බව.	උපලේඛන නඩත්තු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති ,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646	සභාවට අයත් වාහන 17 කට අදාලව ධාවන සටහන් සහ මාසික සාරාංශය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2024 පෙබරවාරි 28 දින තෙක් මාසික සාරාංශ ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් සාරාංශ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.7,694,809 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.502,179 ක් විය.

2.2 මූල්‍ය පාලනය

ගනුදෙනු කිරීමකින් තොරව 2017 වර්ෂයේ සිට පැවත එන රු. 310,601 ක බැර ශේෂයක් ද සහිතව මහජන බැංකුවේ ජංගම ගිණුම සමාලෝචිත වර්ෂය තුලදී ද පරික්ෂා කර එම ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	21,143,319	21,288,975	12,663,573	18,985,255	20,906,576	20,906,576	13,698,866	16,458,437
(ii)	කුලී	13,117,100	17,754,300	16,803,350	9,974,805	22,546,242	22,546,242	15,333,131	10,448,792
(iii)	බලපත්‍ර ගාස්තු	1,785,000	2,001,600	2,002,400	(800)	1,806,800	1,806,800	1,781,600	78,200
		36,045,419	41,044,875	31,469,323	28,959,260	45,259,618	45,259,618	30,813,597	26,985,429

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම්		
(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හා බදු හිඟය රු.16,458,437 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු,10,359,853 ක් හෙවත් සියයට 63 ක් අයකර නොතිබුණි.	2025 වර්ෂයේදි වරිපනම් බදු මුදලින් කොටසක් අය කරගෙන ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ii) වාර්ෂික බිල් කිරීම රු.21,288,975 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.8,625,402 ක් හෙවත් සියයට 41ක් අයකර ගෙන නොතිබුණි.	2025 වර්ෂයේදි වරිපනම් බදු මුදලින් කොටසක් අය කරගෙන ඇති බව.	ප්‍රවර්තන ආදායම් එකතු කිරීමට කටයුතු කළ යුතුය.
(ආ) කුලී		
(i) සමාලෝචිත වර්ෂයට ආරම්භක මස් කඩ කුලී හිඟය එකතුව රු. 8,228,301 ක් වූ අතර වර්ෂය තුලදී කිසිදු මුදලක් අයකර නොතිබුණි.	නීතීමය ක්‍රියා මාර්ග ගෙන ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ii) සමාලෝචිත වර්ෂය සඳහා මස් කඩ බදු කුලී වාර්ෂික ඇස්තමේන්තුව රු.500,000 ක් වුවද වාර්ෂික බිල් කිරීම රු.4,801,200 ක් වීමෙන් ඇස්තමේන්තු හා බිල් කිරීම් අතර රු.4,301,200 ක එනම් සියයට 860 ක විචලතාවයක් නිරීක්ෂණය විය.	තරඟකාරී ටෙන්ඩර් මිල ගණන් ඉදිරිපත් කිරීම නිසා විචලතාවයක් පවතින බව.	ඇස්තමේන්තු අගය හා සත්‍ය අගයන් අතර විචලතාවයන් අවම කිරීමට කටයුතු කළ යුතුය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ** අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.411,100 ක් වූ නොපියවූ අත්තිකාරම් ගිණුම් ශේෂය තුල 1999 වර්ෂයට පෙර සිට පැවත එන රු.104,244 ක නිරවුල් නොකළ ශේෂය සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් කර නොතිබුණි.	කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට ආණ්ඩුකාරතුමාට යොමු කර ඇති බව.	ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 **මෙහෙයුම්** අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1980 සැප්තැම්බර් 09 දිනැති අංක 105/03 අති විශේෂ ගැසට් පත්‍රය මගින් බේරුවල තානායමේ පාලනය නාගරික සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණද ඒ සඳහා ඇති කරගත් ලිඛිත ගිවිසුමක් සභාව සතු නොවීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ තානායම් කුලී රු.1,395,554 ක් නොගෙවීමට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට සභාවට නොහැකි වී තිබුණි.	1984 වර්ෂයේ ලේඛනාගාරයේ ඇති වූ ගින්න නිසා ලේඛන විනාශවී ඇති බව .	තානායම් ගාස්තු අය කර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) බේරුවල නගර සභාව විසින් 2019 අගෝස්තු 26 දින , 2020 ජනවාරි 13 දින හා 2020 ජුනි 03 යන දිනයන්හිදී පිළිවෙලින් රු.4,595,000 ක්, රු.2,995,000 ක් හා රු.4,350,000 ක් ලෙස එකතුව රු.11,940,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධති 28 ක් පුද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබූ අතර ඒ පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.		
i. එකතුව රු.900,000 ක් වැය කර අන්තර්ජාලය හරහා ක්‍රීඩාපිටි හා නගර ශාලා වෙන් කිරීමේ මෘදුකාංග ලබාගෙන තිබුණද ක්‍රීඩාපිටි පහසුකම් සහ නගර ශාලාවක් නොතිබීමෙන් එම පද්ධති ක්‍රියාත්මක කර නොතිබුණි.	වෙනත් මෘදුකාංගයක් ලබාගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ද එම ආයතනයෙන් විමසීම් කර ඇති බව.	අනාර්ථික කාර්යයන් සඳහා සභා අරමුදල් වැය නොකළ යුතුය.
ii. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව මිලදීගත් පරිගණක පද්ධති මෘදුකාංග 28 න් පද්ධති 17 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ක්‍රියාත්මක කරන ලද පරිගණක මෘදුකාංගද අපේක්ෂිත කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව, ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් නොතිබියදීත් සභාවට අවශ්‍ය නොවන මෘදුකාංග මිලදී ගැනීම හා ගිවිසුමේ සඳහන් කොන්දේසිවලට පටහැනිව ගෙවීම් කර සභාවට රු.6,895,000 කට ආසන්න මූල්‍යමය අලාභයක් සිදු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුදල් රෙගුලාසි 104 හා 156 ප්‍රකාරව සභාව විසින් කටයුතු කර නොතිබුණි.	අඩුපාඩු සකස් කර ගැනීමෙන් අනතුරුව මෙම මෘදුකාංගය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවහොත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව .	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ) බේරුවල නගර සභාවේ හිටපු සභාපතිවරයා විසින් බේරුවල නගර සභා බල ප්‍රදේශයට අයත් නොවන බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ගයක් සංවර්ධනය කර ඇති බැවින් 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 184 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස 2022 අප්‍රේල් 06 දින පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.	මේ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රමාණවත් උපදෙසක් නොලැබුණු බව.	පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් පසු විපරම් කර යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු.1,075,410 ක් වූ කායවර්ධන උපකරණ සහිත බේරුවල, මරදාන පිහිටි කායවර්ධන මධ්‍යස්ථානය පුහුණුකරුවෙකු නොමැතිවීම හේතුවෙන් 2023 ජනවාරි සිට නිශ්කාර්යව පවතින අතර කායවර්ධන උපකරණ සෘජුවම මුහුදු සුළංවලට නිරාවරණය වීම හේතුවෙන් වේගයෙන් මළ බැඳීමකට ලක්වීමේ අවදානමක් ද පැවතුණි.	ආයුර්වේද ගොඩනැගිල්ලේ උඩුමහලේ ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසු ස්ථාපනය කිරීමට කටයුතු කරන බව .	කායවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කර උපකරණ ආරක්ෂා කර ගැනීමට හා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර අරමුණු 07 ක් ඉටු කර ගැනීමට රු.2,716,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, රු.300,000 ක් වෙන් කරන ලද තිරසර සංවර්ධන අරමුණු 04 ක් ඉටු කර නොතිබුණි.	ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව.	ඉලක්ක ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.